# විනය නැතිවුණොත් රටක් දියුණු කරන්න බැහැ

## මාදුළුවාවේ සෝභිත හිමියෝ කියති

(අතුරුගිරිය ගුණවතී ඉලංකෝන් මැණිකේ)

"අද මේ රටේ මැතිවරණ ව්‍යාපාරය එන්න එන්නම පහත් තත්ත්වයට වැටෙනවා. මැතිවරණයක්, මැතිවරණයක් පාසා පහත් තත්ත්වයට පත්වෙලා ඒ වැටීමේ එක ලක්ෂණයක් තමයි මැතිවරණ නීති රීති බරපතළ විදිහට උල්ලංඝනය කිරීම. රටක නීතියක් තිබුණාට මදි. ඒ නීති හරිහැටි ක්‍රියාත්මක වන්නේ නැත්නම්. විනය නැති වුණොත් රටක් කවදාවත් හදන්න බැහැ."

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නාගවිහාරාධිපති මාදුළුවාවේ සෝභිත නා හිමියෝ කඩුවෙල නවගමුව ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයේ දී පැවැත්වූ අනුශාසනාවකදී එසේ ප්‍රකාශ කළහ.

මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් කොළඹ දිස්ත්‍රික්කයට ඉදිරිපත් වී සිටින අධිකරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සිය මැතිවරණ ව්‍යාපාරය තුළ නව සංස්කෘතියක් හඳුන්වා දෙමින් ඒ සඳහා මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබාගත් අවස්ථාවේ උන්වහන්සේ එම අදහස් ප්‍රකාශ කළහ.

පෝස්ටර්, කටවුට්, බැනර්, ඡායාරූප, කොඩිවැල් හා රතිඤ්ඤා වලින් තොරව ජනතාව හමුවට ගොස් ඒ සඳහා වැයවන සියලුම මුදල් විහාරස්ථානවල සංවර්ධනය හා දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා යෙදවීමේ මෙම නව මැතිවරණ සංස්කෘතිය වත්මන් දේශපාලනයට ආදර්ශයක් වශයෙන් ක්‍රියාත්මක කරන බව එහි දී ඇමැති මිලින්ද මොරගොඩ මහතා මහ සංඝරත්නය හමුවේ එහි ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් ප්‍රකාශ කළේය.

නවගමුව ශ්‍රී සුගතබිම්බාරාම විහාරාධිපති මල්වානේ පඤ්ඤාසාර, මාදුළුවාවේ සෝභිත, කඩුවෙල සංඛප්පිට්ඨි විහාරාධිපති කඳුබොඩ අමරඥාන, පෝරේ ශ්‍රී මහා විහාරාධිපති රුක්මලේ ධම්මකිත්ති, අතුරුගිරිය සීවලී අසපුවේ



අධිකරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා සිය නව මැතිවරණ ප්‍රතිපත්ති හඳුන්වා දුන් අවස්ථාවේ ඒ පිළිබඳව මාදුළුවාවේ සෝභිත නාහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය ආශිර්වාද කළ අයුරු



ඇමැති මිලින්ද මොරගොඩ මහතා සිය නිලධාරීන් හා මහ සංඝරත්නය සමඟ නවගමුව ශ්‍රී සත්පත්තිනි දේවාලයට ගොස් දේවාශිර්වාදය ලබාගත් අවස්ථාව

විහාරාධිපති පදලංගල ධම්මදේව යන ස්වාමීන්වහන්සේලා ඇතුළු මහ සංඝරත්නයේ සෙත්පිරිත් දේශනයකින් අනතුරුව

**මාදුළුවාවේ සෝභිත හිමියෝ මෙසේ ද පැවසූහ.** "මැතිවරණ නීති රීති පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වෙනමම ආඥාපනතක් තියෙනවා. ඒ නීතිරීති කඩ කරනවා නම් මැතිවරණයකදී මොකක්ද බලාපොරොත්තුවන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදයක් බලාපොරොත්තු විය හැකිද?

අද අපේ රටේ මැතිවරණ නීතිරීති උල්ලංඝනය කරන අලුත් මැතිවරණ සංස්කෘතියක් බිහි කරලා.

මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට කාලය එළැඹිලා, බොහොම කල්. මැතිවරණ නීති රීතිවලින් වැඩක් නැහැ මෙහෙම කඩකරනවානම්."

**නවගමුව රාජමහා විහාරාධිපති මල්වානේ පඤ්ඤාසාර නාහිමියෝ මෙසේ පැවසූහ.**

"අද මේ රටේ දේශපාලන ක්‍රියාවලියේ දී රට කරවන්නට ඉදිරිපත් වන ඇතැම් අය විශාල පරිසර දූෂණයක් සිද්ධ කරනව කියන එක සිහිපත් කරන්න ඕනෑ. මේ පරිසර දූෂණය ඇති කරන්නේ තමන්ගේ ජයග්‍රහණය ගැන පමණක් කල්පනා කිරීම නිසයි.

මිලින්ද මොරගොඩ ඇමැතිවරයාගේ මේ මැතිවරණ ව්‍යාපාරය රටටම ආදර්ශයක්."

**පෝරේ ශ්‍රී මහා විහාරාධිපති රුක්මලේ ධම්මකිත්ති නාහිමියෝ මෙසේ පැවසූහ.**

"පාර්ලිමේන්තුව කියන්නෙ රටේ වැදගත් තීන්දු තීරණ ගන්න ප්‍රධානම ආයතනයයි. පාර්ලිමේන්තුවට අවශ්‍යවන්නේ බුද්ධිමත් දැන උගත් ශීලාචාර සම්පන්න, රට පිළිබඳව ජනතාව පිළිබඳව හැඟීමක් තියෙන වටිනා සත් පුරුෂ නායකයෝ.

යාවුතු නිවැරදි මඟ හඳුනාගත් මිලින්ද මොරගොඩ ඇමැතිතුමා වැනි දේශපාලකයෝ අද පාර්ලිමේන්තුව තුළ සිටිය යුතුයි."

අතුරුගිරියේ සීවලී අසපුවේ විහාරාධිපති පදලංගල ධම්මදේව හිමියෝ කෙටි අනුශාසනාවක් පැවැත්වූහ.

වයඹ පළාත් සභා මන්ත්‍රී සුදත් චන්ද්‍රසේකර, හිටපු අමාත්‍ය ආර්.ඒ.ඩී. සිරිසේන, නවගමුව ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයේ දායක සභාවේ සභාපති තිලකවර්ධන බණ්ඩාර යන මහත්වරුන් ඇතුළු නිලධාරීන්ද මෙම අවස්ථාවට එක්ව සිටි අතර ඇමැතිවරයා ප්‍රමුඛ පිරිස ශ්‍රී සත්පත්තිනි දේවාලයේ දේව පූජාවකටද සහභාගි වූහ.